අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ඊඩී/05/67/SAS/12
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2021.05 .05

සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,
පීඨාධිපතිවරුන්,
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**<u>රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම</u>**
**<u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය සේවයට කැඳවීම.</u>**

2021.04.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021 (I) මඟින් ලබා දී ඇති උපදෙස් අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සේවයට කැඳවීම සම්බන්ධව වහාම ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන මාර්ගෝපදේශ අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

I. රසායනාගාර සහකාර / සේවා සහයක (රසායනාගාර) තනතුරුධාරීන් සඳහා එම තනතුරුධාරීන්ට වාරාන්තර නිවාඩු ලබා දීම පිළිබඳව නිකුත් කර ඇති මගේ අංක ED/ 05/67/14/41/09 හා 2014.12. 22 දිනැති ලිපියෙහි උපදෙස් අනුව වාරාන්තර නිවාඩු කාල සීමාවකදී කටයුතු කරන පරිදි කටයුතු කිරිම.

II. පුස්තකාලයාධිපති, සේවා සහයක (පුස්තකාල) තනතුරුධාරීන් සම්බන්ධව, එම තනතුරුධාරීන්ට වාරාන්තර නිවාඩු ලබා දීම පිළිබඳව නිකුත් කර ඇති මගේ අංක ඊඩී/ 05/67/12/07/08 හා 2015.06.22 දිනැති ලිපියෙහි උපදෙස් අනුව වාරාන්තර නිවාඩු කාලසීමාවකදී කටයුතු කරන පරිදි කටයුතු කිරිම.

III. සේවා සහයක (තාක්ෂණ පීය) තනතුරුධාරීන් සම්බන්ධව, එම තනතුරුධාරීන්ට වාරාන්තර නිවාඩු ලබාදීම පිළිබඳව නිකුත් කර ඇති මගේ අංක ED/ 05/67/11/2 තා.පී-විවිධ හා 2019.06.18 දිනැති ලිපියෙහි උපදෙස් අනුව වාරාන්තර නිවාඩු කාලසීමාවකදී කටයුතු කරන පරිදි කටයුතු කිරිම.

IV. පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සම්බන්ධයෙන්, පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නිවාඩු මැයෙන් නිකුත් කර ඇති අංක ED/ 05/67/27/23 හා 2020.10.19 දිනැති ලිපියෙහි සඳහන් උපදෙස් අනුව, විශේෂ නිවාඩු කාලසීමාවක් සේ සළකා කටයුතු කිරිම.

V. සිසුන් නේවාසිකව නොසිටීමේ හේතුව නිසා සාමාන්‍ය පරිදි සේවය අවශ්‍ය නොවන ශිෂ්‍ය නිවාසාධිකාරි/ සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරි, අරක්කැමි වැනි තනතුරුධාරීන් සඳහා ද ඉහත අංක II හි සඳහන් පරිදි වාරාන්තර නිවාඩු කාලසීමාවකදී පුස්තකාලයාධිපති, සේවා සහයක (පුස්තකාල) තනතුරුධාරීන් සම්බන්ධව කටයුතු කරන පරිදිම කටයුතු කිරිම.




ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162

VI. කෙසේ වෙතත් රාජකාරී ස්වභාවය සහ සේවා අවශ්‍යතාවය අනුව මෙම විධිවිධාන අදාල කර ගැනීමට නොහැකි සේවා සහයක (ආරක්ෂක) වැනි තනතුරු සඳහා මෙම විධිවිධාන අදාල කර ගැනිම අනිවාර්ය නොවන අතර, අභ්‍යන්තරික වැඩපිළිවෙලක් සකසා ගනිමින් ඉහත ක්‍රමවේදය අනුගමනය කිරිම සම්බන්ධව විරෝධතාවයක් නොදක්වනු ලැබේ.

VII. එසේම යම් ප්‍රදේශයක් සෞඛ්‍ය නීති රීති යටතේ හුදකලා කිරීමට හෝ සංචරණ සීමාවන්ට යටත් කිරීමකට භාජනය කොට ඇති අවස්ථාවක එබඳු ප්‍රදේශවල පදිංචි අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සේවයට කැඳවීම සෞඛ්‍ය නීති රීති වලට පටහැනි වන අතර ඔවුන්ව සේවයට කැඳවීම නොකල යුතුය. එම හේතුව නිසා සේවයට නොපැමිණෙන නිලධාරීන්ගේ සේවයට වාර්තා නොකරන දිනයන් ඔවුන්ගේ පෞද්ගලික නිවාඩු වලින් අඩු නොකල යුතුය.

VIII. සේවයට නොකැඳවූ දිනයන්හි වුවද මාර්ගගත ක්‍රමය ඔස්සේ සේවය කළ හැකි කාර්ය මණ්ඩල සාමාජිකයින් එසේ කිරීම සඳහා යොමුකල යුතුය.

2. පාසල් වසා ඇති බැවින් සිසු දරුවන්ගේ පැමිණීමක් සිදු නොවන නිසාත්, මේ වන විට සිසුන් නේවාසික බවින් ඉවත් කර ඇති නිසාත්, ගුරුවරුන් ද පාසලට සේවයට වාර්තා නොකරන නිසාත්, යම් යම් නිලධාරීන්ට ප්‍රායෝගිකව ඉටු කළ යුතු රාජකාරියක් නිශ්චිතව නොමැති බැවින්, සේවයට පැමිණීමේ දී පවතින Covid තත්ත්වය ද සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය සේවා සඳහා අත්‍යාවශ්‍ය නිලධාරීන් පමණක් කැඳවීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. එසේම සේවා සහායක (ආරක්ෂක) තනතුරුධාරීන් හැර සේවා අවශ්‍යතාවය මත සුවිශේෂී රාජකාරී වේලාවන් නියම කර ඇති අනෙකුත් නිලධාරීන් ද මෙහි සඳහන් විධිවිධාන යටතේ සේවය සඳහා කැඳවීමේ දී අනෙකුත් සමාන්තර තනතුරුධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී වේලාව තුළම ඔවුන් ද කැඳවිය යුතු වේ.

3. මෙම උපදෙස් අනුගමනය කරමින් ආයතන ප්‍රධානියා විසින් තම කාර්ය මණ්ඩලය සේවයට කැඳවීමේ ක්‍රමවේදය සකසා ගත යුතු අතර, සේවයට වාර්තා කිරීමට නියම කරන දිනයන්හි යම් කාර්ය මණ්ඩල සාමාජිකයකු සේවයට වාර්තා නොකරන්නේ නම් එම දිනයන් නිවාඩු දිනයන් සේ සැලකිය යුතුය.

4. කිසියම් ආයතන ප්‍රධානියකු අත්‍යාවශ්‍ය හේතූන් මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 (I) යටතේ සඳහන් පරිදි සතියකට දින 03 ක් ඉක්මවා කාර්ය මණ්ඩලය සේවයට කැඳවීමට අදහස් කරන්නේ නම් අවශ්‍යතාවය පැහැදිළි කරමින් අධ්‍යාපන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

5. මෙහි සඳහන් විධිවිධාන සියළුම ඒකාබද්ධ සේවයේ හා ඒකාබද්ධ නොවන සේවාවලට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් අදාල කර ගත යුතුය.

පී.එල්.පත්මකුමාර
අතිරේක ලේකම් ( පාලන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත්:-

1) සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. අ.ක.ස
2) සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. අ.ක.ස